**රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමය - 2019**

**------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 මතය**

**------**

රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1996 අංක 13 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගම් පනතින් සංශෝධිත රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමයේ ආඥා පනතේ (283 අධිකාරය) 18 (2) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, සංගමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්ම සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ . වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනානොගැනීම මඟින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංගමයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංගමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංගමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංගමය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතු භාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතු භාවය, පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවල දී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් සංගමය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට සංගමය වෙත ලැබී තිබුණු වර්ගීකරණය නොකළ ප්‍රේෂණවල එකතුව රු.3,071,058 ක් වූ අතර එය විධිමත් පරිදි හඳුනා ගෙන ගිණුම් ගත කිරීම වෙනුවට ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙම ශේෂය රු.1,111,946 කින් හෙවත් සියයට 57 කින් වර්ධනය වී තිබුණ බව නිරීක්ෂණය විය. | මෙම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | විවිධ ආදායම් හා ලැබීම් විධිමත් පරිදි හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතු වීම. |

## 1.6 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සාමාජිකත්වය අහෝසි වී ඇති සාමාජිකයන්ගේ දායක මුදල් ගිණුමේ නිරවුල් කර නොතිබුණ රු.15,328,125 ක බැර ශේෂය විධිමත් පරිදි හඳුනා ගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. එම ශේෂ අතරින් එකතුව රු.2,167,861 ක් වසර 5 කට වඩා පැරණි ශේෂ බව නිරීක්ෂණය විය. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගත යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ). 1891 අංක 05 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමයේ ව්‍යවස්ථාවේ 16(1), (2) සහ (3) වගන්ති | සංගමයේ 133,134 සහ 135 යන මහ සභා රැස්වීම්වල දී අනුමත වූ රීති සංශෝධන, ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. | රීති සංශෝධන ගැසට් පත්‍රයේ පළ කිරීමට කඩිනමින් අවශ්‍ය කටයුතු කරමින් පවතින බව | නිති, රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම |
| (ආ). රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමයේ සංශෝධිත ව්‍යවස්ථාව | | | |
| (i) I පරිච්ඡේදයේ (1) (10) වගන්තිය | සාමාජිකයෙකුගේ මරණය දැනුම්දී මාස දෙකක් ඇතුලත ඔහුට හිමි ප්‍රදානය ගෙවිය යුතු වුවත්, මිය ගිය සාමාජිකයන් වෙනුවෙන් එසේ ගෙවිය යුතු රු.6,215,000 ක මරණ ප්‍රධාන මුදල් 2019 දෙසැම්බර් 31 දින දක්වාත් ගෙවා නොතිබුණි. | දීමනා හිමිකරුවන් අවශ්‍ය ලේඛනවල මුල් පිටපත් හා මුදල් ලබා ගැනීම සඳහා අදාළ රිසිට් පත් නිසි පරිදි ඉදිරිපත් නොකිරීම නිසා ගෙවීම් ප්‍රමාද වී ඇති බවත් පුද්ගලයන් දැනුවත් කර ගෙවීම් කිරීමට කටයුතු කරන බව. | නිති, රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ii) I වන පරිච්ඡේදයේ 7(ආ)(i) වගන්තිය | ණය වාරික 6 කට වඩා හිඟ හිටි සාමාජිකයන් 15 දෙනෙකු වෙනුවෙන් ව්‍යවස්ථානුකූලව ගත යුතු ක්‍රියාමාර්ග ගෙන | හිඟ මුදල් ද සමඟ නැවත වාරික මුදල් අය කර ගැනීමට හෝ ණය අය කර ගැනීමෙන් පසුව සාමාජිකත්වය | නිති, රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | නොතිබුණ බව නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | අහෝසි කිරීමට කටයුතු කරන බව. | |
| (ඇ). | 2003 ජුනි 02 දිනැති PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වන වගන්තිය | සංගමය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබිණි. | ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරන බව. | නීති, රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම |
| (ඈ). | 2014 පෙබරවාරි 14 දිනැති 2014/1 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සංගමය විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරන බව. | නීති, රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.67,102,229 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.56,626,660 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,475,569 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ණය ලබා දීම මත ලැබී ඇති පොළී ආදායම රු.11,237,159 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ). | සංගමයේ 135 වන වාර්ෂික මහා සභා රැස්වීමේ නිල යෝජනා 1 යටතේ සංගමයේ පවතින ගොඩනැගිල්ල වෙනුවට එම භූමියේ මහල් 4 කින් යුත් නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අදාළව ශක්‍යතා අධ්‍යනයක් කිරීමට යෝජනා වී තිබුණ ද සමාලෝචිත වර්ෂය තුල එය ක්‍රියාත්මක කළ බව විගණනයට නිරීක්ෂණය නොවීය. | ශක්‍යතා අධ්‍යනය ඉදිරියේ දී සිදු කරන බව. | මහා සභා රැස්වීම් නිල යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ආ). | 2019 මාර්තු 28 දින පැවති මාසික කමිටු රැස්වීමේ අනුමැතිය පරිදි දේපළ ණය සීමාව රු. ලක්ෂ 10 සිට රු. ලක්ෂ 12 දක්වා වැඩි කර තිබුණ ද ඒ සඳහා සංගමයේ රීති අනුව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ එකඟතාව ලබා | ණය සීමාව කළමනාකරණ කමිටු තීරණය අනුව සංශෝධනය කර ඇත. ගෙවීම් පැහැර හරින සාමාජිකයන් හඳුනා ගෙන ඔවුන්ගෙන් මුදල් අය කර ගැනීමට වෙනම | කමිටු තීරණ ඵලදායීව ක්‍රියාත්මක කළ යුතු වීම හා අවශ්‍ය අවස්ථාවල භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | ගෙන තිබුණ බව නිරීක්ෂණය නොවීය. තවද, ගෙවීම් පැහැර හැර ඇති සාමාජිකයින් වෙත ජංගම දුරකථනයක් මඟින් කෙටි පණිවිඩ යවා දැනුවත් කිරීම සඳහා 2019 මැයි මස 29 වෙනි දින පැවති කමිටු රැස්වීමේ දී ගෙන තිබු තීරණය ක්‍රියාත්මක කර නොතිබුණු අතර සංගමයට නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් වාර්තාවක් ලබා ගැනීම සඳහා 2019 ඔක්තෝබර් මස කමිටු රැස්වීමේ දී ගෙන තිබු තීරණය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ක්‍රියාත්මක වී නොතිබුණි. | ඒකකයක් පිහිටුවා ඒ වෙනුවෙන් දුරකථන පහසුකම් ලබා දී ඇති බව. | කළ යුතු වීම. |

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ). | 2018 වර්ෂයේ දී සංගමයේ සාමාජිකත්වය ලබා ගත් සාමාජිකයින් 18 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී එකතුව රු.3,010,058 ක ණය ලබාගෙන තිබුුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් මින් කිසිදු ණය වාරිකයක් අයකරගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය. | මේ වන විට තිදෙනෙකුගෙන් මුදල් අය වන බවත් අනෙකුත් මුදල් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කරන බව. | ණය මුදල් අය කිරීමට කඩිනමින් පියවර ගත යුතු වීම. |
| (ආ). | සංගමය විසින් ලබා දී ඇති දේපළ ණය සම්බන්ධයෙන් පරිගණක පද්ධතිය ඇසුරින් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එකතුව රු.10,100,701 ක දේපළ ණය ශේෂයක් පැවති සාමාජිකයන් 10 දෙනෙකු විසින් ණය ගෙවීම් පැහැර හැර ඇති බව නිරීක්ෂණය විය. | නීතිමය කටයුතු ආරම්භ කිරීමට නියමිත බව. | අය කිරීමේ ක්‍රමවේද කඩිනමින් ක්‍රියාත්මක කර ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ). | ඉකුත් වර්ෂ 5 තුල සංගමයේ සංවත්සර සභා රැස්වීම්වලට සාමාජිකයින්ගේ සහභාගීත්වය මුලු සාමාජිකත්වයෙන් ආසන්න වශයෙන් සියයට 11 ත් සියයට 13 ත් | සංවත්සර සභා දිනය වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව සමඟ දැනුම් දීම, පුවත්පත්වල දිනය පල කිරීම හා කෙටි පණිවුඩ | සාමාජික සහභාගීත්වය ඉහළ නංවා ගැනීම සඳහා තවදුරටත් කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අතර විය. මේ හේතුවෙන් සංගමයේ පාලක සභාවට සුදුසු සාමාජිකයින් තෝරා ගැනීම මෙන්ම සංගමයේ අභිවෘද්ධිය සඳහා තීරණ ගැනීම අඩු සාමාජික නියෝජනයකින් සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | මඟින් දැනුම් දීම කරන බව. | |
| (ඇ). | එසේම සංගමය විසින් පවත්වනු ලබන මාසික පාලන කමිටු රැස්වීම් සහ විශේෂ පාලන කමිටු රැස්වීම් සඳහා මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් සාමාජිකයින් දෙදෙනෙකු නම් කර තිබුණ ද අදාළ රැස්වීම් සඳහා ඔවුන්ගේ සහභාගීත්වය දුර්වල මට්ටමක පැවතුණි. ඒ අනුව 2019 වර්ෂයේ දී පවත්වා තිබුණු රැස්වීම් වාර 23 අතරින් එක් නියෝජිතයෙකු රැස්වීම් වාර 17 කට සහභාගී වී නොතිබුණි. | රැස්වීම් පැවැත්වෙන දිනය විධිමත්ව දැනුවත් කරන බවත් ඉදිරියේ දී මෙම තත්ත්වය මඟ හරවා ගැනීමට දැනුවත් කරන බව. | සාමාජික සහභාගීත්වය ඉහළ නංවා ගැනීමට පියවර ගත යුතු වීම. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ). | වාර්ෂික ප්‍රසම්පාදන සැලසුමේ ඇතුළත් රු.2,500,000 ක අයිතමයක් මිලදී ගැනීම සමාලෝචිත වර්ෂයේ දී සිදු කර නොතිබුණ අතර ප්‍රසම්පාදන සැලසුමේ නොමැති එකතුව රු.356,649 ක් වටිනා අයිතම 5 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දී ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. ඒ අනුව, සංගමය විසින් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු නියමිත සැලසුමට අනුව සිදු කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | හදිසි අවශ්‍යතා මත මිල දී ගෙන ඇති බව දන්වා ඇත. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ). | රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමයේ කටුකැලියාව නිවාඩු නිකේතනයට රු.287,860 ක් වැය කර CCTV කැමරා පද්ධතියක් සවි කර තිබුණි. ඊට අදාළ ලංසු ලියවිලි සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය හා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගෙන ඇති බවක් ලිපි ගොනුව අනුව තහවුරු නොවීය. | ප්‍රසම්පාදන කටයුතු කළමනාකරණ මණ්ඩල තීරණය අනුව සිදු කර ඇති බව | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම. |

**3.4** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංගමය සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබුණ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 31 ක් විය. 2017 පෙබරවාරි 13 දින සිට පුරප්පාඩුව පවතින සංගමයේ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් අයෙකු බඳවාගෙන නොතිබුණි. | ලේකම් හා භාණ්ඩාගාරික තනතුර පිරවීම සඳහා අවස්ථා කීපයකදීම අයදුම්පත් කැඳවුව ද සුදුසු අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවූ බව. | විධිමත් පරිදි අයදුම්පත් කැඳවා අදාළ තනතුරට කඩිනමින් නිත්‍ය නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංගමය විසින් 2019 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණ අය වැය ලේඛනයේ වූ විෂයයන් 62 ක අය වැය ගත අගයන් හා තත්‍ය අගයන් අතර සියයට 10 සිට සියයට 100 දක්වා වූ විචලතාවයන් විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන උපකරණයක් ලෙස භාවිත කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂවල දී විචලනයන් හැකි තාක් අවම කර ගන්නා බව. | අය වැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන උපකරණයක් ලෙස භාවිතා කිරීමට කටයුතු කළයුතු වීම. |